# 06 බුදු සිරිත අනුව යමු

සුමංගල මහා විද්‍යාලයේ විදුහල්පතිතුමා කාර්යශූර ය; දක්ෂ ය. තම විද්‍යාලයේ කටයුතු කලට වේලාවට, ක්‍රමානුකූල ව කරගෙන යෑමට ඔහුට මනා හැකියාවක් ඇත. හෙතෙම විද්‍යාලයේ දියුණුව සඳහා ගුරු මණ්ඩලයේ මෙන් ම සිසු දරු දැරියන්ගේ ද සහාය මැනවින් ලබා ගෙන ඇත. මේ නිසා සුමංගල විද්‍යාලය ප්‍රදේශයේ කාගේත් කතා බහට ලක් වූ, ප්‍රශංසාවට භාජනය වූ විද්‍යාලයකි.

මෙම විද්‍යාලයේ විශේෂත්වය වන්නේ අපූරු නායකත්ව කුසලතාවලින් පෝෂණය වූ ගුරු සිසු පිරිසක් දක්නට ලැබීමයි. විදුහල්පතිතුමා බෞද්ධ ප්‍රතිපත්ති මගින් ලද ශික්ෂණය මෙන් ම, බෞද්ධ කළමනාකරණ ඉගැන්වීම් මගින් ලද කුසලතාව ද මත විද්‍යාලය දියුණුව කරා මෙහෙයවයි. පාසල් වටපිටාවේ ප්‍රදර්ශනය වන ආදර්ශ පාඨ නායකත්ව කුසලතා වර්ධනය කර ගැනීම සඳහා බුද්ධ චරිතයෙන් ලැබූ ආදර්ශ සහිත ය. පන්ති කාමර, පුස්තකාලය, කාර්යාලය, ගුරු විවේකාගාරය ආදී සෑම තැනක ම මෙවැනි ආදර්ශ පුවරු දැකිය හැකි ය. පන්ති නායකනායිකාවන්, ශිෂ්‍ය නායකනායිකාවන්, ශිෂ්‍ය සමිති නිලධාරීන්, ක්‍රීඩා නායකනායිකාවන් ආදී විවිධ නායකත්ව භූමිකාවල කටයුතු කරන ශිෂ්‍යශිෂ්‍යාවෝ සිය වගකීම්, යුතුකම් මැනවින් ඉටු කරති. කිසි දිනෙක තම වගකීම් පැහැර හැරි ගුරුවරු හෝ ශිෂ්‍යයෝ හෝ එම පාසලේ දක්නට නො වූහ. විදුහල්පතිතුමන් හිමිදිරියේ විද්‍යාලයේ වැඩ අරඹද්දී සිසු දරු දැරියෝ ද පාන්දරින් අවදි ව ප්‍රබෝධවත් ව පැමිණ දෛනික වැඩ කටයුතු අරඹති. විද්‍යාලයේ වටපිටාව අලංකාර මල් ගොමුවලින් පිරී තිබේ. ඒවායෙහි කඩිසර ව වැඩ කරන සිසුන් ය. පන්ති නායක නායිකාවෝ ද ශිෂ්‍ය නායකනායිකාවෝ ද ඔවුන් මැනවින් මෙහෙයවති. පාසල් ගෙවත්ත සරුසාර රමණීය තැනකි. එහි යුහුසුළු ව වැඩ කරන සිසුන් කඩි රැළක් මෙනි. මෙම විද්‍යාලයේ සිසු දරු දැරියෝ වැඩෙහි කම්මැලියෝ නො වෙති. ඔවුහු සුහද ව කටයුතු කරති. නායකත්වයට ගරු කරති. යහපත් අනුගාමිකයෝ ද වෙති. විදුහල්පතිතුමාට නැවත සොයා බැලීමක් අවශ්‍ය වන්නේ නැත. විද්‍යාලය ආරම්භ වන විට පන්ති කාමරය ඉගෙනුම් පරිසරයකට සූදානම් ය. පන්ති වාර්තා පොත්, ශිෂ්‍ය නාම ලේඛන, පැවරුම් ගොනු ආදී සියල්ල සූදානම් ය. සිසු දරුවෝ අධ්‍යාපනික දර්ශනයක්, ඉලක්කයක් අනුව ඉගෙනීමෙහි යෙදෙති. ඔවුන් චරිතවත් ය; අවංක ය. පාසල අධ්‍යාපනික තෝතැන්නකි. එහි සුන්දරත්වය පිරී'තිරී ගොස් ය. මේ සියල්ල නිවැරදි නායකත්ව දර්ශනයක් මත විද්‍යාලය මෙහෙයවන විදුහල්පතිතුමාගේ ශක්තියයි.

සුමංගල විද්‍යාලයට මෙවන් පරිසරයක් ගොඩ නගා ගැනීමට හැකියාවක් ලැබුණේ යහපත් නායකත්ව ලක්ෂණ පාසල තුළ ක්‍රියාත්මක වූ බැවිණි. වර්ෂය මුල පාසල ආරම්භයත් සමග ම, මෙම පාසලේ නායකත්ව කුසලතා වර්ධනය කෙරෙන වැඩමුළු

පැවැත්වේ. මෙම වැඩමුළුවල දී නායකත්ව කුසලතා පිළිබඳ ව සිසුන් පුහුණුව ලබන්නේ බුද්ධ චරිතය ඇසුරිනි. මේ සඳහා මාර්ගෝපදේශනය ලබා දෙන්නෝ විද්‍යාලයයේ ගරු ස්වාමීන් වහන්සේ සහ බුද්ධ ධර්මය උගන්වන ගුරු භවත්හු ය. මෙහි දී බුදුරජාණන් වහන්සේ තුළ වූ නායකත්ව ගුණාංග පිළිබඳ සිසුහු ඉතා හොඳ දැනුමක් හා ඒ ඇසුරෙන් ප්‍රායෝගික පුහුණුවක් ද ලබා ගනිති. වර්ෂය පුරා කීප වතාවක දී ම මෙම පුහුණුවීම් යාවත්කාලීන කෙරේ. එහි දී බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨ නායකයකු ලෙස ලොවට මාර්ගෝපදේශ ලබා දුන් ආකාරය නිදසුන් සහිත ව සාකච්ඡා කෙරේ. බුදුරදුන්ගේ නායකත්ව ලක්ෂණ බුදු සිරිතේ විවිධ අවස්ථා හා සිද්ධි ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. සිසුන් අතට ලබා දෙන නිබන්ධනයෙහි ඇතුළත් නායකත්ව ලක්ෂණ කිහිපයක් මෙසේ ය.

### චරිතවත්බව

නායකයකුට මනා චරිතයක් අත්‍යවශ්‍ය ය. බුදුරදුන්ට තිබුණේ අතිවිශිෂ්ට චරිතයකි. උන් වහන්සේ රහසින්වත් පව් නො කළහ. ප්‍රසිද්ධියේ එක් ජීවිතයකුත් අප්‍රසිද්ධියේ තවත් ජීවිතයකුත් ගත නො කළහ.

### ආදර්ශවත්බව

ගව රැළක නායකයා ඇදට යන විට අනෙක් ගවයෝ ද ඇදට යති. නායක ගවයා ඍජු ව යන විට රැළේ ගවයෝ ද එසේ යති. ඒ බැවින් නායකත්වය ආදර්ශවත් විය යුතු බව ද නිසි මග යා යුතු බව ද බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබේ. නායකයා අවංක ලෙස කටයුතු කරන්නේ නම් තම අනුගාමිකයෝ ද අවංක වෙති. රාජ්‍ය පාලනයට ද මෙම උපදේශ වැදගත් වේ. තම චරිතය නිවැරැදි කර ගනිමින් ආදර්ශ සම්පන්න වීම නායකයකු සතු උසස් ගුණාංගයකි.

### සමානාත්මතාවෙන් යුතුබව

සමානාත්මතාවෙන් යුතු ව කටයුතු කිරීම ද බුදුරජාණන් වහන්සේ තුළ වූ විශිෂ්ට නායකත්ව ලක්ෂණයකි. බුදුරදුන් පහළ වන විට දඹදිව කුල භේදය දැඩි ලෙස පැතිරී තිබිණි. උසස් පහත් වශයෙන් ප්‍රභේද කොට පැවති සෑම කුලයකට ම අයත් වූවන්ට බුදු සසුනේ පැවිදි වීමට ඉඩ සලසා දුන්නේ උන් වහන්සේ තුළ වූ සමානාත්මතා ගුණය නිසා ය. ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී යන පංච මහා ගංගාවන්හි ජලය මහා සමුද්‍රයට පිවිසි කල එම ජලය වෙන් වශයෙන් නොසලකා මුහුදු ජලය ලෙස හඳුන්වන්නාක් මෙන් කවර වර්ණයකට අයත් පිරිසක් වුවත් සසුන්ගත වූ විට ශාක්‍යපුත්‍රීය ශ්‍රමණ යන නමින් හැඳින්වෙන බව බුදුරජාණන් වහන්සේ වදාළහ. උන් වහන්සේ සියලු මිනිස්

වර්ගයාට ම සමාන මෛත්‍රියක්, දයාවක් දැක්වූ සේක. නායකයකු තම අනුගාමිකයන්ට සමානාත්මතාවෙන් යුතු ව සැලකීම උතුම් ගුණයකි.

### සුදුසු පරිදි වගකීම් පවරනබව

තම ශ්‍රාවකයින්ට නිසි කල්හි සුදුසු පරිදි වගකීම් පවරා දීම බුදුරජාණන් වහන්සේ තුළ වූ නායකත්ව ලක්ෂණයකි. පැවිදි කිරීම හා උපසපන් කිරීම මුල දී බුදුරජාණන් වහන්සේ ම කළමුත් පසු ව ඒ ඒ දිසාවල ශ්‍රාවකයින් වහන්සේලාට එම වගකීම භාර කරන ලදි. ශාසනික කටයුතු විමධ්‍යගත කිරීම බුදුරජාණන් වහන්සේ තුළ වූ විශිෂ්ට නායකත්ව ගුණාංගයකි. උන්වහන්සේ තම පිරිසේ දක්ෂතා හා ප්‍රවීණතා හඳුනාගෙන ඒ අනුව තනතුරු ලබා දුන්හ. ප්‍රඥවන්තයින් අතර අග තනතුර සැරියුත් තෙරණුවන්ට ද, ඍද්ධිමතුන් අතර අග තනතුර මුගලන් තෙරණුවන්ට ද, ධුතාංගධාරීන් අතර මුල්තැන මහා කාශ්‍යප තෙරණුවන්ට ද ආදී වශයෙන් අග තනතුරු පිරිනැමූ බව සඳහන් වෙයි.

### අනුගාමිකයන් ආරක්ෂා කරනබව

බුදුරජාණන් වහන්සේ තම අනුගාමිකයන් බැහැරින් එන උවදුරු චෝදනා ආදියෙන් ආරක්ෂා කළහ. කුමාර කාශ්‍යප මාතාවට දරු ගැබක් පිහිටීම පිළිබඳ සිද්ධියේ දී ඉතා සාධාරණ විනිශ්චයක් ලබා දීම හොඳ ම නිදසුනකි. ශ්‍රාවක පිරිස් නොමග යන අවස්ථාවල දී අනුකම්පාවෙන් අවවාද දී සුමගට හැරවීමට, ඇතැම්විට උපක්‍රමශීලී ව කටයුතු කළහ. නන්ද තෙරණුවන්, ඛේමා බිසව, කාල සිටුපුත් ආදීන් එසේ සුමගට හරවා ගත්තවුන් ය.



**ශිෂ්‍ය නායිකාවට ඇහුම්කන් දෙමින්**

## ඉවසන සුලුබව

බුදුරජාණන් වහන්සේ තුළ වූ උතුම් මානුෂීය ගුණාංගයකි, ඉවසීම. ඇනුම් බැණුම්, නින්ද ප්‍රශංසා ආදී අවස්ථා මෙන් ම ලෙඩ දුක්, සීත, උෂ්ණ, සා පිපාසා ආදිය ද සම සිතින් දරා ගැන්මේ හැකියාව යහපත් නායකයකු සතු ලක්ෂණයකි. අකම්පිත ව ගැටලුවලට මුහුණ දීමට ඉවසීම අත්‍යවශ්‍ය ය.

## යථාවාදී තථාකාරීබව

නායකයා ප්‍රතිපත්තිගරුක, කරන දේ කියන කියන දේ කරන අයකු විය යුතු ය. බුදුරජාණන් වහන්සේ යථාවාදී තථාකාරී යථාකාරී තථාවාදී වූහ. අවංක ව විනිවිදභාවයෙන් කටයුතු කිරීම ද නායකත්ව ගුණාංගයකි. අනුගාමිකයින්ගේ විශ්වාසය ගොඩ නැගෙන්නේ එවිට ය.

## අනුකම්පා සහගතබව

අනුගාමිකයන් ගැන මෙත් සිතින් සානුකම්පික ව කටයුතු කිරීම ද යහපත් නායකත්ව ලක්ෂණයකි. ගිලනුන්ට සියතින් ම උවටැන් කිරීමෙන් බුදුරදුන් තුළ වූ මෙම ගුණය පැහැදිලි වේ. හැඩ ගසා ගැනීම සඳහා සිය ශ්‍රාවකයන්ට විනය නීති රීති පැනවූයේ ද ඇතැම් විට විනය නීති ලිහිල් කෙළේ ද මේ නිසා ය.

## සුහදශීලීබව

ශ්‍රාවකයින් කෙරෙහි සුහදශීලීවීම ද ශ්‍රේෂ්ඨ නායකත්ව ලක්ෂණයකි. වරක් බුදු රජාණන් වහන්සේ ගෝසිංග සල් වනයට වැඩම කෙළේ නවක ශ්‍රාවකයින් මුණ ගැසීමට ය. උන් වහන්සේ පළමුව කෙළේ ශ්‍රාවකයන්ගේ සුවදුක් විචාරීමයි. "ඔබට දරා ගත නොහැකි අපහසුකම් තිබේ ද?" ආදී වශයෙන් සුහදශීලී ව සුවදුක් විචාළහ. සෙනෙහෙබර මවක මෙන්, පියකු මෙන් කටයුතු කිරීම යහපත් නායකත්ව ලක්ෂණයකි.

## නිවැරැදි තීරණ ගන්නාබව

බුදුරජාණන් වහන්සේ විධිමත් කාල සටහනකට අනුව දෛනික කටයුතු සැලසුම් සහගත ව ඉටු කළහ. විචාරශීලී ව, සැබෑ තතු තේරුම් ගැනීමේ හැකියාව නායකයකුට අවශ්‍ය ය. අභිනිෂ්ක්‍රමණයේ සිට ම බුද්ධ චරිතය පුරා නිවැරැදි තීරණ ගත් අවස්ථා බොහෝ ය.

### නිවැරැදි දර්ශනයක් තිබීම

නිවැරැදි දර්ශනයක් තුළ තම අනුගාමිකයන් හසුරුවමින් ඉලක්ක කරා ගමන් කිරීමේ හැකියාව සෑම නායකයකුට ම අවශ්‍ය වේ. අනවශ්‍ය ප්‍රශ්නවලට බුදුරදුන් පිළිතුරු දීම ප්‍රතික්ෂේප කෙළේ දර්ශනයක් ඇති ව ක්‍රියා කළ බැවිනි.

සුමංගල විද්‍යාලයේ විදුහල්පතිතුමා, ගරු ස්වාමීන් වහන්සේ ප්‍රමුඛ ඇදුරු මඬුල්ල බුද්ධ චරිතයෙන් ප්‍රකට වන ඉහත කී නායකත්ව ගුණාංග සිසු දරුවන්ට මැනවින් ප්‍රගුණ කරවූහ; නිතර නිතර පුහුණු කඳවුරු මගින් සිසුන්ගේ නායකත්ව කුසලතා වැඩි දියුණු කළහ. මනා පුහුණුවක් ලද සිසුන් පාසලේ අධ්‍යාපන කටයුතු වගකීමෙන් යුතුව කළ අතර පාසලේ ශිෂ්‍ය නායකනායිකාවෝ, සිය කාර්යභාරය හඳුනාගෙන අනුගාමික සිසුන් මෙහෙයවූහ. මේ නිසා ප්‍රචණ්ඩත්වය, අරගල, වර්ජන වැනි ගැටලු මතු නොවිණි. පාසලෙහි යහපත් සංස්කෘතියක් ගොඩ නැඟිණි. පාසල් මවගේ සෙවණේ දී උසස් පෞරුෂයක් ගොඩනගා ගන්නා දරුවෝ සමාජයට පිවිසෙති. ඔවුහු පාසලේ ගුණාත්මක සංවර්ධනයට ද දයක වෙති; පාසලේ ගෞරවය රකිති. ඔවුහු අනාගත අභියෝග ජය ගනිති. ජාතියේ අවශ්‍යතාවට අනුව හැඩ ගැසුණු කුසලතා පිරි දරුවන් මෙවැනි පාසල්වලින් බිහිවන බවට සැකයක් නැත. එසේ වන්නේ ඔවුන් බුදුරජාණන් වහන්සේ ආදර්ශයට ගෙන ක්‍රියාත්මක වන බැවිනි.

**සාරාංශය**

බුදුරජාණන් වහන්සේ තුළ වූ විශිෂ්ට නායකත්ව ගුණාංග අප්‍රමාණ ය. ආදර්ශවත් බව, සමානාත්මතාව, සුදුසු පරිදි වගකීම් පැවරීම, තම අනුගාමිකයින් ආරක්ෂා කිරීම, ඉවසීම, යථාවාදී තථාකාරී ගුණය, අනුකම්පාව, සුහදශීලීත්වය, නිවැරදි තීරණ ගැනීම ආදී නායකත්ව ලක්ෂණ රැසක් බුද්ධ චරිතයෙහි කැපී පෙනේ. පාසලේ විවිධ නායකත්ව භූමිකා නියෝජනය කරන සිසු දරුවන්ට මෙම ගුණාංග ආදර්ශ කොට ගත හැකි ය. ඒ අනුව හැඩ ගැසෙන පාසල යහපත්, විනය ගරුක, ජාතියට ඔබින දරුවන් බිහි කරයි.


## ක්‍රියාකාරකම්



01. බුදුරජාණන් වහන්සේ තුළ තිබූ නායකත්ව ලක්ෂණ තුනක් පාඩම ඇසුරෙන් සොයා ලියන්න.

02. බුදුරජාණන් වහන්සේගේ යථාවාදී තථාකාරී ගුණය පිළිබිඹු වන අවස්ථාවක් විස්තරාත්මක ව දක්වන්න.

## පැවරුම



ඔබේ පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායකයා හෝ නායිකාව හෝ ඔබ යැයි සිතා ශිෂ්‍ය නායක මණ්ඩලය පුහුණු කිරීමේ වැඩමුළුවක්, බුද්ධ ධර්මය ගුරුතුමා සමග එක් ව සංවිධානය කරන්න.